ජූනි 01, 2022 දින පළ වී තිබූ දිවයින කතුවැකිය තුළ, කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ සම්බන්ධයෙන් සාකච්ඡා කරයි. කෙසේ නමුත්, ලිංගික අපරාධයකට මුහුණ දුන් කාන්තාවකගේ මනෝභාවයන් පිළිබඳව විමසුම් කරන අතරම, කතුවැකිය තුළ දිගින් දිගටම "ස්ත්‍රී දූෂණය" සහ "දූෂණය" යන වචන භාවිතා වෙයි.

ලිංගික අපරාධයන් හැඳින්වීම සඳහා භාවිතා වෙන "දූෂණය" වැනි යෙදුමක ඇති ගැටළුව වන්නේ, එවැනි යෙදුම් ඔස්සේ එවැනි සිදුවීමකට මුහුණ දුන් අයෙකු අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වීමයි. එය ලිංගික අපරාධයකට මුහුණ පෑවෙකු සම්බන්ධයෙන් සමාජය තුළ යම් තාක් දුරකට තවමත් පවත්නා ගර්හාත්මක, කොන් කිරීමේ ආකල්පය තවදුරටත් තීව්‍ර කිරීමට රුකුලක් නොවෙනු ඇති දැයි පාඨක අප විමසිය යුතුයි.

එසේ නම්, "දූෂණය" යන්න වෙනුවට ලිංගික අපරාධය වැනි යෙදුම් භාවිතා කිරීම වඩාත් යෝග්‍ය නොවන්නේද?
එසේත් නැතිනම් ඒ වෙනුවට යෝග්‍ය වෙනත් යෙදුමක් ඔබට යෝජනා කළ හැකිද?